ගොස් භූතයකු ලෙස පළිගත් එතුමා කුකුළෙකුට එළුවෙකුට කරුණාව දක්වන්නේ බුදු දහමේසේම හින්දු ආගමේද ඇති ඉවසීම නැමැති ගුණාංගයේ මහිමයෙනි. එසේම නබි නායකතුමන්ට එරෙහිව ගිය චිත්‍රපටියට බෙරිහන් දෙන මුස්ලිම් ජනතාව උද්ඝෝෂණය කරමින් කියන්නෙ එය නිශ්පාදනය කළ පුද්ගලයින්ට දඬුවම් දියයුතු බවයි. මුන්නේශ්වරම් කෝවිලේ පූසාරිවරයාටද එසේ පැවසිය හැකි වුවත් පවසන්නේ නැත. ඒ සමහර අවස්ථාවලදී ආගමට ඉහළින් බලය ගමන් කරන නිසාය. එහෙත් ඔහු කියන්නේ හාමුදුරුවරුන්ද දානයට මස් වළඳන බවයි. සමහර පන්සල්වල දාන ලැයිස්තුවේ ඉහළින්ම සතුන්ගේ නම් සහිතවම මස් ඉල්ලා දායකයන්ට කරදර කරන බවයි. තමන් නොමැරුවත් ඔනෑතරම් රටේ සතුන් මරන බවයි. සතුන් මැරීමට විරුද්ධව උද්ඝෝෂණය කළ නායක හිමිවරුන් මෙයට තවමත් පැහැදිලි පිළිතුරක් ලබා දී නැත.

ඇමරිකාවටද, මුස්ලිම්වරු ඉල්ලූ දෙයට පිළිතුරක් නැත. මන්ද ප්‍රජාතන්ත්‍රවාදයේ මුදුන් මල් කඩක් ලෙස ලෝකයා තවමත් විශ්වාස කරන අමෙරිකා-වට එම නිර්මාණය කළ පුද්ගලයාට ප්‍රජාතන්ත්‍රවාදයේ නාමයෙන් දඬුවම් කළ නොහැකි හෙයිනි. එහෙයින් ආගම මිණි පහනක් ලෙස හැඳින්වූ කලාකරුවන් අද ජීවත් වූවා නම් නිසැකවම කඳුළු සලනු ඇත. ඒ අද ඒ මිණි පහන තොරණක් කර ජනතාව රවට්ටන දේශපාලඥයන් සේම මිසයිලයක් කරගෙන ලෝකයම විනාශ කරන ආගම්වාදීන් හා තක්කඩියන් බුරුතු පිටින්ම ලොවේ උපදින නිසාය.

එහෙත් අවසාන වශයෙන් සඳහන් කළයුතු කරුණු කිහිපයක් ඇත. තලේබාන්වරු ඇෆ්ගනිස්තානයේ ඓතිහාසික බාමියන් බුද්ධ පිළිම වනාශ කළ විට එදෙස බලා හිත හදාගැනීමට තරම් ශක්තියක් ඇති අනුගාමිකයන් පිරිසක් බුදුදහම තුළින්ම බිහිවුනෝය. අද බුදු රූ හන්දියෙක් ගානේ විකිණීමට ඇත. බොහෝ අන්‍යාගමිකයන් බුදු රූ මිලදී ගන්නේ වතු අලංකාරය සඳහාය. මෑතකදී බුදුන්ගේ හිසමත සූර්ය තාප කෝෂයක් (සෝල පවර්) සවිකර කඳ මැඳ බල්බයක් අල්ලා විකිණීමට තිබුණේ කේ මාට් සාප්පු සංකීර්ණයේය. ඇඳුම් පැළඳුම් සේම කෑම පැකට්වල පවා බුදුන්ගේ රුව කොටා වෙළඳ භාණ්ඩයක් කලා සේ මුස්ලිම්වරුන්ගේ දෙවියන් වෙළඳ භාණ්ඩයක් වූවානම් සිදුවන දෙය කුමක්ද යන්න ඔබ අපට පැහැදිලි කරදිය යුතු නැත. බුදු දහම තුළ ඒ සියල්ල උපේක්ෂාවෙන් විඳ දරා ගැනීමේ ශක්තිය හා භක්තිය ආගම තුළම නිරූපණය කර ඇත. හාමුදුරුවන්ගේ හිස මත තාරගන්නට ඕනෑ යයි සේම, පඩික්කම් පුරවන හාමුදුරුවන් ගැන කතා කළ දේශපාලඥයන් අපරට තුළ බිහිවූයේ ඒ නිදහස නිසාය. චීවරය මුවාවෙන් බුදු දහම විනාශ කරන හාමුදුරුවරුන් ගැනද තවමත් අපට කතා කළ හැක්කේ ඒ නිසාය. කතා කිරීමේ හා අදහස ප්‍රකාශ කිරීමේ අයිතියට සීල් තබමින් මිනී මරන අරාබි ලෝකය තුළ අමෙරිකාවේ මෙන්ම ඕස්ට්‍රේලියාවේ ජීවත්වන මුස්ලිම්වරුන්ට ලැබී ඇති අසීමිත නිදහස ගැනද කිව හැක්කේ එයම පමණි. ඔවුන් තමන්ගේ ආගම වෙනුවෙන් හඬ නඟන්නේ ඒ ප්‍රජාතන්ත්‍රවාදී නිදහස නිසාය. විරෝධතා දක්-වමින් අදහස් ප්‍රකාශකළ හැක්කේ ඒ නිදහස නිසාය. මෙම චිත්‍රපටය මුස්ලිම ලොව කළඹවන්නට කල නොහොඹිනා අධම ගණයේ නිර්මාණයක් බව සත්‍යයකි. එහෙත් ෂල්මන් රුෂ්ඩි නස්දින්ලාට මරණ දඬුවම නියම කල ආගමක නායකයින් විශ්වයේ දියුණුවත් සමග වෙනස් නොවන්නේ ඇයි. දෙවියන් වහන්සේ නිර්මාණය කළ මිනිසා තමන්ගේ බුද්ධිය, විශ්වාසය මත තබා මේ සැරසෙන්නේ ලොවේ විනාශයටය. කැලේ සත්වයා විනාශ කිරීමට තව සත්වයෙක් ඇත්තා සේ මිනිසාට එරෙහිව මිනිසාව විනාශ කරන්නේ ඒ විශ්වාශයි. දෙවියන් වහන්සේ මේ වැඩිවන ජනගහණය පාලනය කරන්නේ එමිනිසාට නොදැනීමයි. ලොව කිසිදාක විනාශ වන්නේ නැත. වැනසෙන්නේ එය මත ජාතින් ආගම අතර පිල් බෙදමින් පිනුම් ගසන මිනිසා පමණි. ලෝක විනාශය යනු එයයි.





